## විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.09.05
## පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)

2023 වර්ෂයේ III කාර්තු වෙහි III වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023.09.05 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2023.09.05 වන දින ප.ව.2.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**සහභාගී වූ නිලධාරීන්**

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.ජී.හෙට්ටිආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ සහකා`ර විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය
03. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
04. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කර්යාලය (බ.ප.)
05. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
06. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
07. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
10. චතුරිකා මුණිදාස මිය - ගණකාධිකාරි (ගෙවීම්) - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
11. පී.ඩී,ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කොළඹ.
12. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
13. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
14. එෆ්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
15. එච්.එස්.චන්දන මයා- ප්‍රාදේශීය ඉංජිනේරු - මිනුවන්ගොඩ.
16. ආර්.ඒ.විජයප්‍රිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
17. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
18. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
19. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
20. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
21. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
22. එස්.එස්.මිල්ලනියගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
23. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.
24. ජේ.එන්.වික්‍රමරත්න මයා - (පරිපාලන නිලධාරි රා.ආ,) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
25. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
26. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
27. ඩබ්.කේ.එම්.ඩී.එන්.කුලසේකර මෙය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

| | කාරණය | සාකච්ඡා වූ කරුණු/ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | මාසික බැංකු සැසඳුම් | කොළඹ හා බත්තරමුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල 2023 අප්‍රේල් මාසය දක්වාත් හෝමාගම 2023 මැයි දක්වාත් බියගම 2023 ජුනි දක්වාත් පමණක් අභ්‍යන්තර විගණනය වෙත වාර්තා ඉදිරිපත් කර ඇති බවත්, කාර්යාල දෙකකින් මෘදු පිටපත වෙනුවට දෘඩ පිටපත් එවා ඇති බවත් බැංකු සැසඳුමේ මෘදු අභ්‍යන්තර විගණනය වෙත එවා ඇති බවත් බැංකු සැසඳුමේ මෘදු පිටපත පමණක් ප්‍රමාණවත් බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. අදාල මස බැංකු සැසඳුම්හි මෘදු පිටපත ඊලග මස 15 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙස නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 02 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවිම. | ණය ශේෂ එකවර පියවීමට කටයුතු කරන ලෙස 2018 වර්ෂයේ සිට සෑම වර්ෂයකම විගණන විමසුමට ඇතුලත් කැර ඇති බවත්, මේ සම්බන්ධයෙන් විගණනය විසින් පළාත් පාලන කොමසාරිස්ව දැනුවත් කිරිමට හැකියාවක් පවතිද යන්න විමසන ලදි.<br>පළාත් පාලන ආයතන විසින් ණය ශේෂ මාසික වාරික වශයෙන් පියවනු ලබන බැවින් මේ සම්බන්ධයෙන් පරික්ෂාකර බලා එම ජේදය ඉවත් කිරිමට ඉදිරි කටයුතු කරන බව විගණන අධිකාරි ප්‍රකාශ කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි |

| අනු අංකය | නිලධාරිගේ නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය | 2023.08.31 දිනට අයවිමට ඇත ණය ශේෂය රු. |
|---|---|---|---|---|
| | පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් | | | |
| 1 | ඒ.එස්.අමරසිංහ | කළ.සේවා. සහකාර | 2016.01.16 | 116,239.00 |
| 2 | පී.ජේ.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2018.02.28 | 123,160.00 |
| 3 | එස්.එම්.වඩුගේ | කළමනාකරණ සහකාර | 2018.11.05 | 47,260.00 |
| 4 | සි.කේ.කාන්තුලාගේ | රියදුරු | 2019.06.03 | 94,695.00 |
| 5 | ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර | කළමනාකරණ සහකාර | 2020.01.01 | .122,110.00 |
| 6 | ඩබ්.සී.එස්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.01.17 | 43,860.00 |
| 7 | පී.ජී.එල්.ආලෝකා | තාක්ෂණ නිළධාරි | 2020.02.10 | 134,180.00 |
| 8 | අයි.ජී.ආර්.පෙරේරා | කළමනාකරණ සහකාර | 2020.02.17 | 125,218.00 |
| 9 | එන්.පී.ඩබ්. ජයවර්ධන | සංවර්ධන නිලධාරි | 2021.12.15 | 68,843.00 |
| 10 | ඒ.එස්.ඒ.සිල්වා | තාක්ෂණ නිළධාරි | 2022.03.31 | 111,015.00 |
| 11 | ඩබ්.එස්.අබේවික්‍රම | කළමනාකරණ සහකාර | 2022.03.28 | 78,370.00 |
| 12 | එස්.යු.විමලසිරි | කළමනාකරණ සහකාර | 2023.01.01 | 145,000.00 |
| | | | | 1,228,950.00 |

<table>
<tr>
<td></td>
<td></td>
<td>
<table>
<tr><td></td><td colspan="4">රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථානමාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශධුත සේවය සඳහා</td></tr>
<tr><td>1</td><td>එම්.එච්.ගුණසේකර</td><td>කළමානකාරණ සේවා නිලධාරි</td><td>2020.02.07</td><td>117,600.00</td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td colspan="4">සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ</td></tr>
<tr><td>13</td><td>ආර්.ජ්.එම්.එම්. රණසිංහ</td><td>තාක්ෂණ නිලධාරි</td><td>2013.01.15</td><td>119,689.00</td></tr>
<tr><td></td><td></td><td colspan="3">නඩු පැවරිම සඳහා ගොනුව ප්‍රධාන නීති නිලධාරි විසින් නීතිපති දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇත</td></tr>
<tr><td></td><td colspan="4">වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ</td></tr>
<tr><td>14</td><td>පී.ජ්.එල්.එස්. පෙරේරා</td><td>විදුලි කාර්මික</td><td>2019.12.03</td><td>13,563.00</td></tr>
</table>
</td>
<td></td>
</tr>
<tr>
<td>03</td>
<td>කල් ඉකුත්වූ තැන්පතු</td>
<td>දෙවන කාර්තුව අවසානයේ වසර දෙක ඉක්මවු තැන්පතු 94 ක් තිබු බවත් දැනට වසර දෙක ඉක්මවු තැන්පතු 10 ක් පවතී. එබැවින් වසර දෙකට වැඩි සියළුම රැඳවුම් ආදායමට ගැනිමට කටයුතු කරන ලෙසත් අවශ්‍ය අවස්ථාවලදි ආදායමෙන් ආපසු ගෙන අදාල ආයතනයට ගෙවිමට කටයුතු කරන ලෙසත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුවන්ට දැනුවත් කරන ලදි.</td>
<td>නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු</td>
</tr>
<tr>
<td>04</td>
<td>මීගමුව ධීවර සමිතිය<br><br>අවිස්සාවේල්ල ඉඩම</td>
<td>1. මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි භූමිය හා නව කාර්යාලය පිහිටි භූමිය ප්‍රාදේශීය ලේකම් වෙතින් පළාත් සභාවට පවරා ගැනිමටත්,<br><br>මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල වෙනත් පළාත් සභා කාර්යාලයකට ලබාදිමට ඉදිරි කටයුතු කිරිමටත් තිරණය විය.<br><br>2. අවිස්සාවේල්ල සබරගමුව බස් සමාගම බදු දි ඇති ඉඩම සහිත ගොඩනැගිල්ල සම්බන්ධයෙන් 2023.06.14 දින ප්‍රධාන ලේකම් (බ.ප.) සමඟ සිදුකල සාකච්ඡාවේදි පළාත් සභාවට අයත් දේපලක් විනාශ වී යාමට ඉඩකඩ ඇති බැවින් හා පවතින තත්ත්වය යටතේ වර්තමාන තක්සේරු කර ඇති මුදලට බදු ගිවිසුමකට යාමට නොහැකි බැවින් ද මාස 03 ක කාලයක් ලබා දී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් ගොඩනැගිලි පරිශ්‍ර යෙන් ඉවත් කර ගැනීම සඳහා දැනුම් දිමටත්, ගොඩනැගිලි පරිශ්‍රයෙන් ඉවත් වීම සඳහා 2023.09.30 දින දක්වා කාලය ලබා දිමට ගිවිසුම්ගත වීමකින් තොරව දැනට ගෙවන මාසික කුළිය 2023 ජුනි මස සිට අයකර නොගැනිමට ද තිරණය වි ඇත.<br><br>පසුව සබරගමුව බස් සමාගමේ නියෝජතයෙකු ගරු ආණ්ඩුකාරතුමා හමුවි නැවත ගොඩනැගිල්ල ලබාදෙන ලෙස ඉල්ලිමක් කර ඇත. එම ඉල්ලිම සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ප්‍රධාන ලේකම් හරහා ආණ්ඩුකාර කාර්යාලය වෙත යොමු කර ඇති බවත් ගරු ආණ්ඩුකාර තුමාගේ තීරණය අනුව ඉදිරි කටයුතු කිරිමට තිරණය විය.</td>
<td>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි(රා.ආ)/ මීගමුව ප්‍රාදේශිය ඉංජිනේරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි (රා.ආ)/ හෝමාගම ප්‍රාදේශිය ඉංජිනේරු</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම ලිපි ගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ක්‍රියාත්මක කිරිම සඳහා 2023.06.15 සහ 2023.06.16 දෙදින තුළ Zoom තාක්‍ෂණය ඔස්සේ පැවති රැස්වීමේදි අදාළ උපදෙස් ලබා දි ඇති අතර අදාළ ලිපි Scan කර මෘදුකාංග පද්ධතියට ඇතුලත් කිරිමට අවශ්‍ය පුහුණුව ලබා දි ඇති බවත්, මේ වන විට Process Automation ක්‍රියාවලි කිහිපයක් ද ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය කටයුතු කර ඇති බවත් අධ්‍යක්ෂ ඉංජින්රු විසින් පැහැදිලි කරන ලදි.<br><br>මෙම මෘදුකාංගය පද්ධතිය තවම මෙම කාර්යාලයට පවරා නොමැති බවත් එය සහ ITRD ආයතනය සතුව ඇති බවද පැහැදිලි කිරන ලදි.<br><br>මේ වන විට ගිවිසුම් කාලය ඉක්මවා ඇති බැවින් ගිවිසුම් කාලය දිර්ඝ කිරිමට EPIC අයතනය සමඟ සාකච්ඡා ඉදිරිකටයුතු කිරිමට ITRD ආයතනය දැනුවත් කිරිමට තිරණය විය<br><br>මෙම මෘදුකාංගය න් සඳහා විශාල වියදමක් දරා ඇතත් එහි ප්‍රතිඵලයක් තවම නොමැති බවත්. ඒ සඳහා කඩිනමින් ඉදිරි කටයුතු සිදු කිරිම | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| 06 | වාහන පරිපාලනය සම්බන්ධ | 1. ර.ප.ව.ලේඛ 30/2016 හි 3.1 පරිච්ඡේදය ප්‍රකාරව මෙතෙක් පරික්‍ෂා කර නොමැති කාර්යාල හැකි ඉක්මනින් ඉන්ධන පරික්‍ෂව සිදු කිරිම්<br><br>2. ඉන්ධන ඇණුවුම් කිරිමේදි ධාවන සටහන් පොත් නිසි පරිදි ඉන්ධන තුලනය කර ඇද්ද යන්න පරික්‍ෂා කර ඉන්ධන ඇණුවුම් නිකුත් කිරිම නිරන්තරව පරික්‍ෂාවට ලක්කිරිම.<br><br>3. තවම රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය නොකර ඇති සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරිමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම.<br><br>4. වාහන අළුත්වැඩියාවන් කිරිමේදි යොදනු ලබන අමතර කොටස් සම්බන්ධයෙන් මීට පෙර සිදු කරන ලද අළුත්වැඩියාවන් ලොග් පොතේ සටහන්ද පරික්‍ෂාකර නිර්දේශ ලබා දීම.<br><br>ඉහත කරුණ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ හා සියළුම ප්‍රාදේශීය කාර්යාලවල විෂයභාර නිලධාරින් සහ රියදුරන් දැනුවත් කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ව හා පරිපාලන නිලධාරි (රා.ආ.) දැනුවත් කරන ලදි.<br><br>වාහන අළුත්වැඩියා වලදි ඉවත් කරනු ලබන කොටස් හා වෙනත් යන්ත්‍ර අළුත්වාඩියාවලදි ඉවත් කරනු ලබන කොටස් අබලිර් ද්‍රව්‍ය ලේඛනයක ඇතුලත් කරන ලෙස අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි. | සියළු ප්‍රාදේශිය ඉංජිනේරුවරු/ පරිපාලන නිලධාරි(රා.ආ) |
| 07 | කාර්යාල නිල ඇඳුම් | නැවත දැනුවත් කිරිමට තිරණය විය. | සියළුම ප්‍රාදේශීය ඉංජිනේරු /පරිපාලන නිලධාරි (රා.ආ) |

## 2 ) ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිගේ හා විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරීම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | ඉංජිනේරු කාර්යාංශයට අදාලව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී බොහෝ ව්‍යාපෘති සඳහා මිල උච්ඡාවචනයන් සඳහා ගෙවීම් සිදු කර ඇති බවත් මාස 03 කින් නිමකල යුතු වැඩ මාස 6 ක් 8 ක් වැනි කාලයක් ගත කර ඇති බව නිරීක්ෂණය වූ බවත්, ම |
| 2 | එකම ව්‍යාපෘතියක වැඩ සඳහා කොන්ත්‍රාත් කරුවන් කිහිප දෙනෙකුට මාරුවී ගොස් ඇති බවත් |
| 3. | ව්‍යාපෘතිහි වැඩ අවසන් කිරීමට වසර ගණනක් ගතවී ඇති බවත් එම නිසා වැඩි වියදමක් දැරීමට සිදුව ඇති බවත් එය අවම කර ගැනීමට කටයුතු කල යුතු බවත්, ගිවිසුම්ගත කාලය නොඉක්මවා නියමිත දින වකවානුවලදී ගොඩනැගිල්ල නිමකර භාරදීමට අවධානය යොමු කරන ලෙස |
| 4. | ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ගේ දැඩි අධීක්ෂණයෙන් කටයුතු කරන්නේ නම් සිදුවන අඩුපාඩු අවම කර ගැනීමට හැකියාව ඇති බවත්, |
| 5 | මේ අනුව කාර්ය සාධක දර්ශක පහල අගයක් පෙන්නුම් කරන බවත්, |

## (3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරීම්

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | කළුතර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් නිල නිවාසවල අයිතිය බස්නාහිර පළාතට පවරා ගැනීමට කටයුතු කරන ලෙසත්. |
| 2. | අභ්‍යන්තර විගණන කළුතර කාර්යාලය පිහිටා තිබූ කළුතර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් නිල නිවාසය තවම කාටවත් දී නොමැති බව. |
| 3. | කළුතර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් නිල නිවාස වල රු.80,000/- ක හිඟ ජල බිල්පතක් පවතින බව. |
| 4. | නැබඩ ආයුර්වේද රෝහලේ සිදු කරන ලද ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම 2,318,512.50 වන බවත් අවසන් බිල්පත අනුව සිදුකර නොමැති වැඩ (Work Not Done) වටිනාකම 1,078,245.88 ක් නිරීක්ෂණය වූ බවත් එහි ප්‍රතිශතය 46% ක් බව, |
| 5 | සමහර ව්‍යාපෘතිහි ව්‍යාපෘතියේ අමතර වැඩ Extra works හා අතිරේක වැඩ Excess work 10% වැඩි අගයක් පවතින බව, Not Done විශාල ප්‍රමාණයක් ඇති බවත්, මේ නිසා ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සැකසීමේදී මේ සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු බව |
| 6 | ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේ දී වැට් සක්‍රියව පවතිද යන්න සම්බන්ධයෙන් නිරන්තර පරීක්ෂාවෙන් සිටිය යුතු බව |
| 7 | Complain Management මෘදුකාංග පද්ධතියට පැමිණිල්ල දැම්මද ඒ සම්බන්ධයෙන් කටුතු කිරීමට සැහෙන කාලයක් ගතවන බැවින් මේ මෘදුකාංගය පිළිබඳව සෑහීමකයට පත්විය නොහැකි බව. යන් සඳහා විශාල වියදමක් දරා ඇතත් එහි ප්‍රතිඵලයක් තවම නොමැති බවත්. ඒ සඳහා කඩිනමින් ඉදිරි කටයුතු සිදු කිරීම. |
| 8 | හොරණ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අදාල බප/හො හඳපාන්ගොඩ මහ විද්‍යාලයේ නල ළිඳට අදාල ජල බට පුපුරා ඇති බවට එම පාසැලේ විදුහල්පති විසින් අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක ප්‍රකාශකල බවත් මේ සම්බන්ධයෙන් පැහැදිලි වාර්තාවක් ගෙන්වා ගැනීමට. |
| 9 | ප්‍රධාන කාර්යාලයේ අංක KE - 7262, CAA – 7039, CAH – 4653, හා KW – 8548 දරණ වාහන අනතුරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු අවසන් කර ඇත්ද යන්න. |
| 10. | යම් හානියක් සිදු වූයේ නම් එය හානිය සිදු වූ දිනම හානිපාඩු ලේඛනයේ සටහන් කල යුතුබව |

**අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්ගේ අදහස් හා පැහැදිලි කිරීම**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බස්නාහිර පළාත් තොරතුරු සම්පත් සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයෙහි තොරතුරු තාක්ෂණය සම්බන්ධව අදාල කාර්යයන් ඉටු කිරීම , ඊට අදාල පද්ධතීන් පිළිබඳ නඩත්තු කිරීම් හා සේවා කටයුතු පවත්වාගෙන යාමට අදාලව පාලන අංශයෙන් සිදුකරන ලද ගෙවීම් කටයුතු මේ වසරේ සිට පළාත් ඉංජිනේරු කාර්යාංශයට පැවරීමට කටයුතු කර ඇති බැවින් එම ගෙවීම් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන මිලියන 97 ක් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඇති බවත් මෙම වසරේ බිල්පත් ගෙවීම සඳහා එම ප්‍රතිපාදන ලබාදිය හැකි බවත් ප්‍රකාශ කරන ලදි. |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා අදාල කරුණු සාකච්ඡාකිරීම ඉතා වැදගත් බවත්, එම කරුණු සම්බන්ධයෙන් විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදී ඉතා ප්‍රයෝජනවත් බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගි විම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, ගණකාධිකාරි( ගෙවීම්), සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගි වූ සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියළුල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 4.45 ට පමණ අවසන් කරන ලදි.

කේ.ආර්.අබේසිරිවර්ධන මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.